2024/02/02

C102
2024/02/02

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
රජරටක මැලේරියා වසංගතය, ශ්‍රී ජයවර්ධනපුර කොටුව, ශ්‍රී ලංකාව.
மாலேரியா தொற்றுநோய், ஸ்ரீ ஜயவர்தனபுர, கொழும்பு, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

නාවික හමුදා මූලස්ථානය
My No: MOD/DEF/GS2/E ALW 8/SL A/1 (102)
Your No:
Date: 19 FEB 2024

තැ.පෙ. P.O. Box 572 | දුරකථන Telephone 2430860-9, 2430870-8 | ලේකම් Secretary | දු.අංක/Tel. - 011 2381154 | ෆැක්ස්/Fax - 011 2541529 | ඊ.තැපෑල/Email : secdef@defence.lk | දිනය Date

SUB SR No 23

NAVAL HEADQUARTERS
07 FEB 2024
(02)

SO DI NAP
BUDGET & FINANCE

යුද්ධ හමුදාධිපති
යුද්ධ හමුදා මූලස්ථානය

නාවික හමුදාධිපති
නාවික හමුදා මූලස්ථානය

ගුවන් හමුදාධිපති
ගුවන් හමුදා මූලස්ථානය

අමද අංක 1982/305(09) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වැටුප් හා දීමනා ලබමින් සිටියදී වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර ජීවිතක්ෂයට පත් වූවහොත් එම මියගිය සාමාජිකයින්ගේ යැපෙන්නන්ට හමුදා සාමාජිකයාගේ වයස අවුරුදු 55 වන තෙක් වැටුප් හා දීමනා ගෙවීම.

යොමුවන්:
අ. අංක MOD/DEF/GS2/SALW/8/SLA/1(96) හා 2023.12.27 දිනැති මෙම අමාත්‍යාංශ ලිපිය
ආ. අංක අමප/23/2527/603/061 හා 2024.01.24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (පිටපත අමුණා ඇත).

02. ගිරිෂානන්ද කරුණාටිලක මහතාණන් විසින් අත්සන් කරන ලද "අ" දරන ලිපිය වශයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත දැනුම්දීම් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/2527/603/061 හා 2023.12.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා යොමුවූ "ආ" දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පහත කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය හිමිව ඇත.

"2009.05.19 දිනට පෙර යුද්ධමය වාතාවරණය පැවති වකවානුවේ තුස්තවාදී ක්‍රියා හේතුවෙන් අනාථවූව, වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගොස් ඇති හමුදා සාමාජිකයින්ට සමාන වන පරිදි සංදේශයේ 3 ඡේදයේ 3.1 අනුඡේදයෙහි සඳහන් ඉල්ලීමක් ක්‍රියාත්මක කිරීම"

03. ඒ අනුව, 2009.05.19 දිනට පෙර යුද්ධමය වාතාවරණය පැවති වකවානුවේ තුස්තවාදී ක්‍රියා හේතුවෙන් අනාථවූව, වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගොස් ඇති හා අමප අංක 1982/305(09) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව වැටුප් හා දීමනා ලබමින් සිටින හමුදා පුද්ගලයා වයස අවුරුදු 55 එළඹීමට පෙර මියගිය අවස්ථාවකදී, ඔහුගේ යැපෙන්නන් වෙත ඔහු ජීවත්ව සිටියේ නම් ඔහුගේ වයස අවුරුදු 55 එළඹෙන දිනය දක්වා හිමිකැන්වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

04. ඒ අනුව, මෙම අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආවරණය වන හමුදා සාමාජිකයින්ගේ ලිපිගොනු මෙම අමාත්‍යාංශය වෙත යොමුකර යැපෙන්නන් වෙත හමුදා සාමාජිකයාගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

විජිතක අබේකෝන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පා-III)
පරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්

By Col N
Action : DGHS
DGP
DG(B&F)
DNLS

NAP

By DG (B&F)
Action : DN DFP

Additional Secretary (Administration) | Additional Secretary (Defence) | Chief Financial Officer - I | Additional Secretary (Foreign Relations and Development) | Additional Secretary (Civil Defence and Home Affairs) | Chief Financial Officer - II | Director General (Finance) | Additional Secretary (Technical)

A/sec II
P/SEC
Sig :
Date : 8/2

DI PAY SECTION
13 FEB 2024
වැ.අ. 105
SO (DP)